කෝරළෙයි පත්තු ප්‍රාදේශීය සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය
--------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 03 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 19 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කොරළෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය, මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
-------------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත්කර තිබූ නමුත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 අනුව නිසිපරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු ගිණුම්
--------------------

සේවය හැර ගිය සහ විශ්‍රාම ගිය සේවකයන් දස දෙනෙකුගෙන් අයවියයුතු රු. 131,679 ක ණය ශේෂය මරණ පාරිතෝෂිකයන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර 2013 වර්ෂයේ සිට දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.3 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම
------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ශනය විය.

| නීති, රීති හා රෙගුලාසිවල යනාදියට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | | |
| | (i) | පරිච්ඡේදය 1 වගන්තිය 5 (XII) | මුදල් ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුනද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |

(ii) පරිච්ඡේදය III වගන්තිය 81 — ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයෙදීද ඉදිරිපත් කර නොතිබුණි.

(iii) පරිච්ඡේදය X වගන්තිය 193 — වර්ෂයේ තත්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් විස්තර අයවැය ලේඛනය සමඟ සංසන්දනය කර විචලනයන් සඳහා හේතු දක්වන විස්තර ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ පුනරාවර්තික වියදම් ඉක්මවූ ආදායම් රු. 10,734,838 ක් වූ අතර, එය සැසඳීමේදී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 4,843,123 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,891,715 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 වරිපනම් හා බදු

වරිපනම්

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134, 158 සහ 159 වගන්තිවලට අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි ඉඩම්, ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි යනාදිය සඳහා 1989 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාවූ කාල පරිච්ඡේදය සඳහා වරිපනම් බදු තක්සේරුකර අයකර ගැනීම සඳහා කටයුතුකර නොතිබුණි.

#### 2.2.2 බදු කුලිය

(අ) පාසිකුඩා වාහන ආරක්ෂක කරන ස්ථානය බදුදීම

පහත කරුණු නිරීක්ෂණය විය

(i) පාසිකුඩා වෙරළ ප්‍රදේශයේ වාහන නවතා තබන ස්ථාන බදු දීමේදී ටෙන්ඩර් කොන්දේසි අනුව, ටෙන්ඩර් මුදලින් සීයට 50 මුල් අවස්ථාවේදීම ගෙවියයුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී මෙම ස්ථානය බදු ගත් අය ගෙවියයුතු රු. 648,000 ක මුදලින් රු. 200,000 ක්

පමණක් 2014 ජනවාරි 20 දින ගෙවා තිබුණි. තවද දින 7 ක් ඇතුලත සහ මාස 03 ඇතුලත ගෙවියයුතු රු. 448,000 ක කොටස් මුදල් මෙතෙක් ගෙවා නොතිබුණි.

(ii) එසේම ඉකුත් වර්ෂයේ මෙම ස්ථානය බදු දීම සම්බන්ධයෙන් අවම ටෙන්ඩර් මුදල වශයෙන් රු. 1,600,000 ක් තීරණය කර තිබුණද රු. 1,100,000 ක් පමණක් බදුකරුගෙන් අයකරගෙන තිබුණි. ඉතිරි රු. 500,000 ක් මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

(ආ) පාසිකුඩා අංක 01 සහ අංක 02 දරන ඇඳුම් මාරු කරන ස්ථාන බදුදීම
--------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අංක 01 ඇඳුම් මාරු කරන ස්ථානය
----------------------------------------

ඇඳුම් මරු කරන ස්ථානය රු. 320,000 ක මුදලට ලබාගත් අය ටෙන්ඩර් කොන්දේසි අනුව ටෙන්ඩර් මුදලින් අඩක් වන රු. 160,000 ක් මුදලක් 2013 දෙසැම්බර් 31 දිනට ගෙවීයුතු වූවද 2014 ජනවාරි 16 දින රු. 80,000 ක් පමණක් ගෙවා තිබුණි.

(ii) අංක 02 ඇඳුම් මාරු කරන ස්ථානය
----------------------------------------

මෙම ඇඳුම් මාරුකරන ස්ථානය 2013 දෙසැම්බර් 31 දින එක් අයෙකුට රු. 580,000 ක මුදලට බදු දී තිබුණි. මෙම ටෙන්ඩර්කරු 2014 ජනවරි 13 දින රු. 220,000 පමණක් ගෙවා බදු ගෙන තිබු අතර ඔහුගෙන් අයවියයුතු රු. 360,000 ක මුදල සභාව විසින් මෙතෙක් අයකරගෙන නොතිබුණි.

(ඇ) පාසිකුඩා වාහන නැවතුම්පොල සහ ඇඳුම් මාරුකරන ස්ථාන සම්බන්ධයෙන් බදු ගත් දෙදෙනෙකුගෙන් අයවියයුතු රු. 1,789,600 ක බදුකුලිය වර්ෂ තුනකට වඩා වැඩි කාලයක සිට අයනොවී හිඟව තිබුණද එය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

2.2.3 වෙනත් ආදායම්
-----------------

සංචාරක හෝටල්, ආපන ශාලා සහ නවාතැන් වලින් ආදායම් අයවීම පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි පාසිකුඩා ප්‍රදේශයේ පවත්වාගෙනයනු ලබන ප්‍රධාන සංචාරක හෝටල් නවයකින් අයවියයුතු බලපත්‍ර ගාස්තු ප්‍රමාණය මෙතෙක් අයකරගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

1995 වර්ෂයෙ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා සේවක විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායක මුදල වන රු. 2,037,203 ක මුදලක් ගෙවියයුතුව තිබුණද එය ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

4 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) අයවැය පාලනය